# දහත් වටගුව

චූටි මල්ලි

## අපි පියවරු

පියවරුනගේ දිනයට සෙට් වෙලා තිබුණ පාටියකට යන්න උනා ගිය සතියේ. වැඩේ ඕගනයිස් කරල තිබුණෙ එතනට එන පවුල් වල බිරින්දෑවරුයි. දරුවොයි. වැඩේ හැම පාටියකම සිදුවන සාමාන්‍ය පරිදි වෙයි කියලා හිතාගෙන හිටියට එදා වෙනස් වුනා. මේ අද්දැකීම චූටි මල්ලිට ලැබිලා තිබුණෙ නැති නිසා ලියන්න හිතුණා.

පාටිය පටන් අරන් ටික වේලාවකින් හදිසියෙම ලොකු සර්ප්‍රයිස් කේක් එකක් සබයට ආවා. ඒ කේක් එකේ පැමිණි පවුල් වල පිය වරුන්ගේ නම් බොහොම පියකරුව අයිසින් කර තිබුණා. කේක් ගෙඩිය කපන්න උනේ වයසින් අඩු පියාට. ඔහු කේක එක කපලා වැඩිමල්ම පියාට මුලින් කවා අනුපිළිවෙලින් සියලුම පියවරුන්ට කැව්වා. ඒක හරි බොළඳ වැඩක් වගේ පෙනුණාට සුන්දර මොහොතක්. ඊට පස්සෙ අංගය සියලුම පිය වරුන්ට මව්වරුන්ගෙන් ලැබුණ තෑගි පිරිනැමීමයි. මේ සියල්ල පියවරුන් කිසිවෙක් නොදැන සංවිධානය වීම නිසා අපි හිටියේ ටිකක් හොල්මන් වෙලා. ඊළඟට දරුවන් විසින් සියලුම පවුල් වල අතීත සහ වර්තමාන ඡායාරූප මගින් හැදූ වීඩියෝවක් ප්‍රදර්ශනය කෙරුණා. ඊට පස්සෙ ස්තුති කතාවෙන් පසුවයි පාටිය සාමාන්‍ය තත්වයට පත්වුණේ. වැඩේ නැගලා ගියේ ඒක මරු වැඩක් නිසයි.

ගෙවල් වලදි මොනව හරි දෙනවට වඩා අම්මලයි දරුවොයි තාත්තලාගේ ශ්‍රමයට කැපවීමට අගයක් අවුරුද්දකට සැරයක් හරි මේ විදිහට දෙන එකෙත් පොඩි ගතියක් තියෙනවානේ. කාලය මොන තරම් දේ වෙනස් රලද? සංක්‍රමණික ප්‍රජාව ඔස්ට්‍රේලියානු සමාජ ප්‍රවාහයට මුසු වෙනවා කියලා කියන්නෙ ඉතිං මේකටම තමයි. ලොක්කා ආපු දවස්වල මව්වරුන්ගේ පියවරුන්ගේ පෙම්වතුන්ගේ දිනවලට පොඩි සමච්චලයක් දාපු අපි අද ඒකෙ ආතල් එක විඳිනවා. කෙනෙකුට හිතෙන්න පුලුවන් මේවා ගොන්පාට් කියලා. හැබැයි ඒක රියල් විදිහට විඳින්න ලැබුණාම තමයි ඒ අදහස් වෙනස් වෙන්නෙ. කාලය තමයි මාර පොර.

## හොඳ ප්‍රවණතාවක්

මාලිංගව නැවතත් ජාතික සංචිතයට කැඳවලා ඒෂියන් කප් එක වෙනුවෙන් සෙල්ලම් කරන්න. ඒක හොඳ තීරණයක්. මාලිංගගේ දැන් බැහැලා යන කාලේ වුණත් අපේ ටීම් එකේ සංයුතිය දිහා බැලුවම මිනිහ ඉන්න එක හොඳයි කියන මතයේ තමයි චූටි මල්ලි ත් ඉන්නෙ. ටීම් වර්ක් එකකදි වැඩක් නූනත් ක්ලාසි පොරවල් නිකං හිටියත් අනෙක් එවුන්ට ඒක ලොකු මොරාල් එකකට හේතු වෙනවා.

ඇත්තම කියනවානම් මේක ලියන්න ගත්තේ මැච් ගැන කියන්න නෙවෙයි. අපේ ග්‍රවුන්ඩ්ස් වල මැච් එකට පස්සෙ ක්ලීන් කරන ට්‍රෙන්ඩ් එකක් දැන් හැදිලා තියෙනවා කියන ආරංචිය තවත් පතුරුවන්න ඕනෙ නිසයි ඒ ගැන ලියන්න හිතුවෙ. අපේ ක්‍රීඩා ලෝලියෝ ශත වර්ෂයකට විතර පස්සෙ ලෝකෙන් හොඳ දෙයක් ආදර්ශයට අරගෙන පිළිපදින්න පටන් ගත්ත එකට මෙන්න අපේ




සැලියුට් එක. හැමදාම අපි පිටින් ගත්ත තරමක් ගත්තෙ පට්ට මෝඩකම් මිසක් හොඳ දේවල් නෙ වෙයිනෙ. මෙදාපාර ආදර්ශය ගත්තෙ ජප්පන්ගෙන්. උන් කොහොමත් පිරිසිදුකමට එක දෙන ජාතියක්නෙ. උන් ඒක ලෝකයටම ආදර්ශයක් විදිහට සොකර් වර්ල්ඩ් කප් එකේදි ප්‍රායෝගිකව පෙන්නුවා. අපේ කට්ටිය දැන් ඒක ෆලෝ කරන්න ගත්ත එක ගැන චූටි මල්ලිට මාර හැපි.

හැබැයි මේකත් මතක් කරන්න ඕනෙ. මල්ලිලා අපි ජප්පොන්ගෙන් පස්ස වැඩේ පටන් ගත්ත තමයි. ඒත් ඒක රටටම ආදර්ශයක් විදිහට ලංකාවේ මුලින්ම පටන් ගත්තෙ නම් ජෙප්පො යි. ඒගොල්ලන්ගෙ හැම රැළියකටම පස්සෙ දහස් ගණන් ගැවසුණ පිට්ටනි මුළින් තිබුණ විදිහටම පිරිසිදු කරලා තමයි ආපහු බාරදෙන්නෙ. අවාසනාවකට රටේ මිනිස්සුන්ට ඒක වැදගත්වුණේ නැහැ. ජප්පො කලාට පස්ස තමයි ඇස් ඇරුණේ. කමක් නැහැ. ඒකෙ ගෞරවේ ජප්පන්ට ගියත් ජෙප්පන්ට ගියත් ක්ලීන් වෙන්නෙ අපේ රටනේ. ජයවේවා. ඔහොම යං.

## ටර්න්බුල් ගියාට පස්සෙ

අපි ඉතින් ඕස්ට්‍රේලියාවේ දේශපාලනය ගැන හැමදාම කතා කරන්නෙ පොඩි රෙස්පෙක්ට් එකක් එක්කනෙ. ඒත් ඉතින් පහුගිය දවස්වල මෙහේ සිද්දවෙච්ච අලකලංචි දැක්කම ටයි කෝට් දාලා හිටියත් උනුත් එකයි මුනුත් එකයි කියලා නොහිතුනාම නෙවෙයි. හැබැයි අපේ සමහර කට්ටිය කියනව වගේ ඇත්තටම මුන් සේරම එකයි  කිසි වෙනසක් නෑ එහෙයි මෙහෙයි ඉන්න ඔක්කොම දේශපාලකයෝ අණ්ඩයෝ කියලා කියන්න තරම් චූටි මල්ලි දරුණු වෙන්නෙ නැහැ. මොකද මොකා බලයට ඇවිත් ආණ්ඩු වෙනස්වුණාට රජය වෙනස් වෙන්නෙ නැති හින්දා. ඒකනේ අපට වටින්නෙ.

ඇත්ත තමයි. ඇබට් යටින් ඉඳන් ගානට දුන්නෙ මහින්දට චන්ද්‍රිකා දුන්න ගේමම තමයි. ලේබර් එකේ ජූලියා රඩ්ට දුන්න ගේමම තමයි. අනෙක් අතින් ඇබට්ට දුන්න ගේමම තමයි ටර්න්බුල්ට ආපහු කැරකිලා වැදුණේ. දේශපාලනේ ගේම් එහෙම තමයි. එහෙයි මෙහෙයි සමාන කරන්න හදන අය ආණ්ඩුවෙයි රජයෙයි වෙනස දන්නෙ නැහැ. තේරුම් ගන්න ට්‍රයි කරන්නෙත් නැහැ. බනින එක සේරටම වඩා ලේසි නිසා. ලෝකේ කොයි රටෙත් දේශපාලනය කරන්නෙ අමුතු විශේෂිත සත්තු කොට්ඨාශයක් නෙවෙයි. උනුත් ඇට සම් ලේ නහර වලින් හැදිලා හැඟීම් දැනීම් සංවේදනා තියෙන මිනිස්සු කොටසක්. වෙනස තියෙන්නෙ කොටමසට සංවේදනා පාලනය කිරීමට ශික්ෂණයක් තියෙනවා. කොටසකට නැහැ. අවාසනාව කට අප අයත් වෙන්නෙ දෙනෙවි කොටසට. ඒකයි වෙනස. බලන්න දැන් කොහොම හරි එහෙම එකක් නූන ගානට රට ඉස්සරහට යනවා. සිස්ටම් එක හැදිලා තියෙන්නෙ ඒ විදිහට. ආණ්ඩුවේ ඔලු මාරු වුණාට ක්‍රමය වෙනස් කරන්න පුලුවන්ද? ආන්න පින්වතුනි ඒව තමයි අපි ඉගෙනගන්න ඕනෙ.

## සැප්තැම්බරය ඇවිත්

හැම අවුරුද්දෙම සැප්තැම්බරය එද්දි චූටි මල්ලිගෙ හිතේ ඇතිවෙන සිතුවිල්ලක් තියෙනවා. "අනේ සැප්තැම්බරයක ලංකාවට යන්න ඇත්නම්" වෙන මොකකටවත් නෙවෙයි. සැප්තැම්බරයේ සාහිත්‍ය මාසය විඳගන්න. පොත් ප්‍රදර්ශනයට යන්න. පොත් එළිදැක්වීම් වලට යන්න. සාහිත්‍යවේදීන් ඇසුරු කරන්න.

චූටි මල්ලි චූටිම කාලෙ තාත්තා සාහිත්‍ය මාසෙට ගුණසේන එකෙන් පොත් මිටියක්ම ගෙනත් දෙන පුරුද්දක් තිබුණා. එකවර පොත් සිය ගණනක් ලැබුණම පුංචි දරුවෙකුගෙ හිතේ ඇතිවෙන්නෙ කොයි තරම් සතුටක්ද? මොබයිල් ෆෝන් රූපවාහිනී අරවා  මේවා නොතිබුණ යුගයක පොත් කියවීම පිස්සුවක් කරගෙන හිටිය දරුවෙකුට එයිටත් වඩා තෑග්ගක් කොයින්ද? සති ගාණක් ගතවෙන්නෙ ඒ පොත් වලට කවර දාන්න. අනුඅංක දාලා චූටි මල්ලිගෙ පුංචි පුස්තකාලෙට ඒ පොත් ඇතුල් කරගන්න. ඒ අතීතය සුන්දරයි. අපේ දරුවන්ටත් ඒ අතීත අත්දැකීම ලබා දෙන්න පුලුවන්නම් කෙයි තරම් හොඳයිද කියලා හිතෙනවා. ඒත් මේ සටනින් අපි පැරදෙයිද කියලා හිතෙනකොට ලොකු වේදනාවක් එනවා. ඒත් පැරදෙන්න ඉස්සෙල්ලා උත්සාහයක් ගන්න ඕනෙනෙ. ඒ නිසා මේ සාහිත්‍ය මාසෙදි අපේ දරුවන්ට පොත් කියවීම ගැන කියා දෙමු. පොතක් කියන්නෙ තවත් ලෝකයක් කියන එක කියා දෙමු. පොතක පිටු අතරින් ලෝකය දකින හැටි පෙන්නලා දෙමු. ඒක වැඩිහිටි අපේ යුතුකමක්.

